# තිරිසන් අපායේ දුක - හැඳින්වීම

"මහණෙනි,

අවිද්‍යාවෙන් වැසී ගෙන තණ්හාවෙන් බැඳී ගෙන අඳුරු වී ගෙන ඔබත් මමත් පැමිණියා වූ මේ දිර්ඝ සංසාර ගමනෙ දී, ඔබ අප සැම දෙනා ම එළුවන් වී බෙලි කැපුම් කෑමේ දී ගළා ගිය රුධිරය මේ මහාසාගරයේ ජලයට වඩා වැඩි ය. බැටළුවන් වී , ඌරන් වී , කුකුළන් වී , ගවයන් වී, බෙලි කැපුම් කෑමේ දී ගළා ගිය රුධිරය සිවු මහාසාගරයේ ජලයට වඩා වැඩි ය.

එසේ ම සොරුන් වීමෙන් රාජ අපරාධ කරුවන් වීමෙන් බෙලි කැපුම් කෑමේ දී ගළා ගිය රුධිරය මේ මහාසාගරයේ ජලයට වඩා වැඩි යි. මහණෙනි, මේ තරම් දීර්ඝ සංසාර ගමනක් අපි ආවෙමු. එසේ පැමිණි ගමනේ දී වින්ද දුක අනන්ත ය. "

-- පාවෙය්‍යක සූත්‍රය - සංයුත්ත නිකාය --

අප විසින් ඔබට ලබා දුන් **තිරිසන් අපායේ දුක** - CD තැටියෙන් අප ඔබට ඉදිරිපත් කරන්නේ අපට ඇස් පනාපිට දක්නට ලැබෙන සතර අපායෙන් එක් අපායක් වන තිරිසන් අපායේ දුක පිළිබඳ ව යි. නමුත් මෙයින් ද මුළු මහත් තිරිසන් අපායේ ම දුක් පෙනෙන්නේ නැත. නො පෙනෙන දුක් අනන්ත අප්‍රමාණ ය. මේ ආකාරයට ම තවත් මීටත් වඩා දුක් ඇත්තා වූ පියවි ඇසට නො පෙනෙන ප්‍රේත - නිරය ආදි අපායයන් ගැන භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත.

මෙම CD තැටියෙන් දක්නට ලැබෙන තිරිසන්ගත සත්ත්වයන් එම දුක් විඳිනුයේ අනෙක් හේතුවක් නිසා නොව පෙර ජීවිතවල දී සිත - කය - වචනය යන තුන් දොරින් රැස් කර ගත් අකුසල් නිසා ම ය.

ඒ නිසා මෙය නරඹන ඔබත් සිත - කය - වචනය යන තුන් දොර රැක ගෙන අඩු තරමින් නිති පන්සිල්වත් රකිමින් හැකි තරම් ධර්මයෙහි යෙදීමට උත්සාහ කළ යුතු ය. මෙම CD තැටියෙන් දක්නට ලැබෙන තිරිසන්ගත සත්ත්වයන් මෙන් අප ද මේ ආකාරයේ දුක් අනන්නත අප්‍රමාණ ලෙස විඳින්නට ඇත. අඩු තරමින් සෝතාපන්න වී හෝ ධර්මය අවබෝධ නො කළහොත් ඉදිරියේ දී ද අපට මෙවැනි දුක්ඛිත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වනු ඇත.

මෙම CD තැටිය ඔබට ඉදිරිපත් කර ඔබ ව නිර්මාංශ කර වීම අපගේ අරමුණ නො වේ. '**අප්පමාදේන සම්පාදේථ**' යන බුද්ධවචනට අනු ව නිවන පිණිස පවතින ඔබගේ ප්‍රමාදය දුරු කිරීම මෙහිලා අපගේ අරමුණ යි. සසර දුක තරණය කිරීම පිණිස අප්‍රමාදී වීම බෙහෙවින් ආනිසංසදායක වේ.

එබැවින් මෙම CD තැටි නරඹන නුවණැති සත්පුරුෂයෝ සංසාරය පිළිබඳ ව බිය ඇති කර ගෙන දුකින් පිරුණු සංසාරයෙන් අත්මිදී ලබන උතුම් නිවන් සැපත කරා ළඟා වීමට වහ වහා උත්සාහ කරත්වා!

'වයධම්මා සඞ්ඛාරා, අප්පමාදේන සම්පාදේථ...'

මෙයට,
මෙත් සිතින්,
පුණ්‍ය ශ්‍රී තුෂන්ත
Editor of www.sadaham.net
(ශ්‍රී සද්ධර්ම මන්දිරය)
+94-71-4417813